මහා නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

නාගරික සංවර්ධන අධිකාරිය

# බත්තරමුල්ල "සෙත්සිරිපාය" අදියර 1 සංකීර්ණයේ පිහිටි ප්‍රධාන ආපනශාලාව මාසික කුලී පදනම මත පවත්වාගෙන යාම සඳහා මිල ගනන් කැඳවීම

කොන්ත්‍රාත් අංක : **PD/Sethsiripaya/Canteen/0002/2017**

1. නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ආදායම් කාර්යයන් සඳහා වන මිල ගනන් කැඳවීමේ ටෙන්ඩර් මණ්ඩලය (සුළු), සභාපති විසින් ඉහත සඳහන් කොන්ත්‍රාත්තුව සඳහා සුදුසු සේවා සපයන්නන් වෙතින් මුද්‍රා තබන ලද මිල ගනන්/යෝජනා කැඳවනු ලැබේ.

2. අභිලාෂයක් දක්වන සේවා සපයන්නන් විසින් වැඩිමනත් තොරතුරු සහ මිල ගනන් ලියකියවිලි බත්තරමුල්ල, "සෙත්සිරිපාය", බිම් මහල, සීමාසහිත ලංකා තානායම් සමාගම, (නාගරික සංවර්ධන අධිකාරිය සතු පරිපාලිත සමාගමකි) අධ්‍යක්ෂ (තානායම් කළමණාකරන) (දුරකථන අංක 011 - 2863102 ) වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවන ගාස්තු වන රුපියල් පන්දාහක් (රුපි. 5,000/=) + බදු සහිතව ගෙවීමෙන් 2017 නොවැම්බර් මස 01 දින සිට 2017 නොවැම්බර් මස 10 වන දින දක්වා සතියේ දිනවල පෙ. ව. 9.00 සිට ප.ව. 2.30 දක්වා කාලය තුල මිල ගනන් ලියකියවිලි ලබා ගත හැක.

3. ලංසු ඉදිරිපත් කිරීමේදී ලංසු සුරක්ෂණය රුපි. 10,000/- වන අතර එය 2018 පෙබරවාරි මස 01 දින දක්වා වලංගු විය යුතුය.

4. ඉදිරිපත් කරනු ලබන මිළ ගනන් පිටපත් දෙකකින් යුතුව ලංසු වෙනම කවරවල බහා බත්තරමුල්ල, "සෙත්සිරිපාය", 6 වන මහල, නාගරික සංවර්ධන අධිකාරිය, ආදායම් කාර්යයන් සඳහා වන මිල ගනන් කැඳවීමේ ටෙන්ඩර් මණ්ඩලය (සුළු), සභාපති වෙත 2017 නොවැම්බර් මස 17 දින පෙ. ව. 11.00 ට හෝ ඊට ප්‍රථම එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන මිල ගනන්/යෝජනා ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාර ගැනීම අවසන් කිරීමත් සමගම පැමිණ සිටින නමකර ඇති ලංසු තබන්නන්ගේ නියෝජිතයන් ඉදිරියේදී ලංසු විවෘත කරනු ලබේ.

සැලකිය යුතුයි : සියලුම අයිසීබී, එන්සීබී, සහ එල්සීබී ප්‍රසම්පාදන හා අයහාර ටෙන්ඩර් දැන්වීම් නාගරික සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවිය වන *www.uda.gov.lk* වෙතින් දිස්වනු ඇත.

සභාපති
ආදායම් කාර්යයන් සඳහා වන -
- මිල ගනන් කැඳවීමේ මණ්ඩලය (සුළු),
6 වන හා 7 වන මහළ
"සෙත්සිරිපාය"
බත්තරමුල්ල.